**සමුපකාර තොග වෙළඳ සංස්ථාව -2017**

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (සංස්ථාවේ) සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහයේ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් සංස්ථාව සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2019 නොවැම්බර් 28 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ එහි පරිපාලිතයන් ඇතුළත් සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

**LKAS 16 :- දේපල පිරියත හා උපකරණ**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.590,999,051 ක් වූ සංස්ථාවේ ගොඩනැගිලි, කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි වැඩිදියුණු කිරීම්,යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද සහ තවමත් භාවිතයට ගනු ලබන සංස්ථාවට අයත් යන්ත්‍ර 01 ක, මෝටර් රථ 69 ක, කාර්යාල උපකරණ 80 ක සහ පරිගණක හා පරිගණක උපාංග 120 ක ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාව සතුව භෞතිකව නොපැවති රු.4,143,032 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය තොගයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවසන් තොග යටතේ දක්වා තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ බැංකු ගිණුමට ලද රු.8,684,772 ක් වූ ඍජු ප්‍රේෂණ හඳුනාගෙන අදාල ගිණුම්වලට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑහි වටිනාකමින් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාගමක කොටස් දායකත්වය වෙනුවෙන් සංස්ථාව විසින් එම සමාගම වෙත බදු පදනම මත සපයා ඇති ගොඩනැගිලි සඳහා 2005 වසරේ සිට 2011 වසර දක්වා සමුච්චිත බදු කුලී වටිනාකම වූ රු.66,986,483 ක් ද සමාගමෙහි පරිහරණය සඳහා සංස්ථාව විසින් සපයන ලද ස්ථාවර වත්කම්වල වටිනාකම වූ 54,722,228 ක් ද වශයෙන් රු.121,708,711 ක මුදලක් හිලව් කර තිබුණි. මෙම වටිනාකමින් සමාලෝචිත වර්ෂය දක්වා සංස්ථාව වෙත කොටස් වෙන්කර දී නොමැති රු.98,909,871 ක් මූල්‍ය ප්‍රකාශන වල දිගුකාලීන වත්කම් යටතේ ආයෝජන අත්තිකාරම් වශයෙන් දක්වා තිබුණද එම වටිනාකම සම්බන්ධයෙන් අදාල සමාගම විසින් එකඟතාවය පළකර නොතිබුණු අතර එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඈ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය සහ පෞද්ගලික ආයතනයකට බදු පදනම යටතේ ලබා දුන් ගොඩනැගිල්ලක් පිහිටි ඉඩමේ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.2,415,000,000 ක් වුවද එහි වටිනාකම රු.2,621,600,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ආයෝජන දේපලවල වටිනාකම රු.206,600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සංස්ථාවේ ගොඩනැගිලි 04 ක ප්‍රත්‍යාගණන අගය රු.4,008,100 ක් වුවද , එය රු.1,615,100 වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම රු.2,393, 000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දින වන විටත් සංස්ථාව වෙත අයිතිය පවරා නොගත් ස්වාධිපත්‍ය දේපල යටතේ වූ ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.12,600,000 ක් ගොඩනැගිලි වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) රු.112,943,520 ක ප්‍රත්‍යාගණන වටිනාකමකින් යුතු සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීමට අදාල අයිතම 15 ක් රු.68,868,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ ගිණුමේ ශේෂය රු.44,075,520 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) බාහිර පාර්ශවයක් විසින් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා භාවිතා කරමින් පැවති ලියාපදිංචි අගය රු.407,292 ක් වූ මහමග දිරාපත් වෙමින් පැවති සංස්ථාවට අයත් ඩීමෝ වර්ගයේ ලොරි රථය මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ යටතේ දක්වා තිබුණි.

## 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සංස්ථාව විසින් කල්බදු පහසුකම යටතේ රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු මෝටර් රථ 99 ක් වෙන්දේසි කිරීමෙන් අදාල බැංකුව ලද මුදල සහ ගිණුම් ගතකරන ලද මුදල අතර රු.2,091,584 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණයට ඉදිරිපත් නොවීය.

## 2.2.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගම් වන සී/ස සීඩබ්ලිව්ඊ ඉකොනොමික් සෙන්ටර්ස් (පුද්) සමාගම සහ සී/ස සීඩබ්ලිව්ඊ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් (පුද්) සමාගම යන සමාගම්වල විගණනයට භාජනය නොකළ මූල්‍ය ප්‍රකාශන යොදා ගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.106,091,470 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.504,948,375 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.611,039,845 කින් අඩුවී තිබුණි. සංස්ථාවේ ප්‍රවාහන අංශයේ අලාභය රු.37,287,545 කින් අඩුවීම, වර්ෂය තුළ ක්‍රියාත්මක කල ව්‍යාපෘති වලින් රු.349,582,016 ක ලාභයක් ඉපයීම හා මූල්‍ය වියදම රු.321,434,899 කින් අඩුවීම ඉහත ඌණතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 කාරක ප්‍රාග්ධන තත්ත්වය

සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.758,230,251 ක් වූ අතර ඒ හේතුවෙන් සමාගමට සිය වත්කම් තුළින් එහි වගකීම්වලට මුහුණ දීමේ හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. රු.7,687,816,732 ක් වූ විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු මුදල් හා බැංකු ණය ශේෂ මෙම තත්ත්වයට බලපෑ ප්‍රධාන හේතුව වී තිබුණි.

### 3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත 2020 මැයි 19 වන දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.